# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/26 - 2012 ඔක්තෝබර් 31 වැනි බදාදා - 2012.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

*ව්‍යවස්ථාපිත නිශ්චය අංකය* : 4626.
*විශේෂ අංකය* : කො/3440.

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය (නාම මාත්‍රිකව පමණි)**

ජාඇල, ඒකල, කොටුගොඩ, නිවාසිපුර, සී 56 දරන නිවසෙහි පදිංචි ලීලාවතී ෂන්මුගම් මහත්මිය විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදීන්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කාරියට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඇයට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම් කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි උපලේඛනයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07,
2012 ඔක්තෝබර් මස 25 වැනි දින.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ කදුකර ඉහල කෝරලය සුළු කොට්ඨාසයේ මහර (කොටසක්) කොට්ඨාස අංක 12 මහර ගම්පොල පළාත් ආණ්ඩු සහා සීමාව තුළ මහර (පළාත් ආණ්ඩු සභාවෙන් පිට කොටස) දැල්පිටිය යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුර මහ 853 හා දැක්වෙන ඕර්වේල් වතුයාය සහ සවනෙක් වත්ත නමැති ඉඩම්වල කැබලි අංක 2, 3, 4. 5, 6, 7 දරන බිම් කැබලිවලින් නොබෙදූ අ. 50, රූ. 0, පර්. 0ක ප්‍රමාණය ඇති බිම් කොටස් සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

11 - 600

1A - G 16833 — 340 (2012/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.